(අටවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක 13.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

---

**2020 පෙබරවාරි 19 වැනි බදාදා අ.භා. 1.00 ට**

---

# පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** විදේශ සබඳතා අමාත්‍යතුමා සහ නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** තොරතුරු සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යතුමා

ගරු **එස්. එම්. චන්ද්‍රසේන මහතා,** පරිසර සහ වනජීවී සම්පත් අමාත්‍යතුමා සහ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා,** රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **ආරුමුගන් තොණ්ඩමන් මහතා,** ප්‍රජා සවිබලගැන්වීම් සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි කර්මාන්ත සහ අපනයන කෘෂිකර්ම අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** කාර්මික අපනයන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා සහ සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **චමල් රාජපක්ෂ මහතා,** මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා,** තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** රාජ්‍ය කළමනාකරණ හා ගිණුම් කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වාසුදේව නානායක්කාර මහතා,** ජල සම්පාදන පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුසන්ත පුංචිනිලමේ මහතා,** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන්දික ප්‍රනාන්දු මහතා,** සංචාරක ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා,** ජාත්‍යන්තර සහයෝගීතා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරක බාලසූරිය මහතා,** සමාජ ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුර ප්‍රියදර්ශන යාපා මහතා,** අභ්‍යන්තර වෙළඳ සහ පාරිභෝගික සුභසාධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රොෂාන් රණසිංහ මහතා,** මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් ලාන්සා මහතා,** ප්‍රජා සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගාමිණී ලොකුගේ මහතා,** නාගරික සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** අපනයන කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විදුර වික්‍රමනායක මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** තේ කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජයන්ත සමරවීර මහතා,** පරිසර රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තිලංග සුමතිපාල මහතා,** තාක්ෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** නිවාස රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **තලතා අතුකෝරල මහත්මිය**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **වජිර අබේවර්ධන මහතා**

ගරු **අශෝක් අබේසිංහ මහතා**

ගරු **සිසිර කුමාර අබේසේකර මහතා**

ගරු **ජෝන් අමරතුංග මහතා**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **රංජිත් අලුවිහාරේ මහතා**

ගරු **වසන්ත අලුවිහාරේ මහතා**

ගරු **(ආචාර්ය) එස්. එම්. මොහමඩ් ඉස්මායිල් මහතා**

ගරු **ටී. බී. ඒකනායක මහතා**

ගරු **ගයන්ත කරුණාතිලක මහතා**

ගරු **අකිල විරාජ් කාරියවසම් මහතා**

ගරු **ෆයිසාල් කාසිම් මහතා**

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා**

ගරු **නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා**

ගරු **මනෝ ගනේසන් මහතා**

ගරු (වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය

ගරු දයා ගමගේ මහතා

ගරු පියසේන ගමගේ මහතා

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු මලිත් ජයතිලක මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු ලකී ජයවර්ධන මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු පලනි දිගම්බරම් මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු මුහම්මදු නසීර් මහතා

ගරු එස්. බී. නාවින්න මහතා

ගරු ඉ. වාල්ස් නිර්මලනාදන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු කරුණාරත්න පරණවිතාන මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු අජිත් පී. පෙරේරා මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු හරින් ප්‍රනාන්දු මහතා

ගරු ඒ. ඩී. ප්‍රේමදාස මහතා

ගරු සජිත් ප්‍රේමදාස මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු එස්. ප්‍රේමරත්න මහතා

ගරු චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු පාලිත රන්ගේ බණ්ඩාර මහතා

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු තාරානාත් බස්නායක මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු විජයකලා මහේස්වරන් මහත්මිය

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා

ගරු අර්ජුන රණතුංග මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු සමන් රත්නප්‍රිය මහතා

ගරු සාගල රත්නායක මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු අංගජන් රාමනාදන් මහතා

ගරු රන්ජන් රාමනායක මහතා

ගරු වරුණ ලියනගේ මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු රනිල් වික්‍රමසිංහ මහතා

ගරු ඒ. ඒ. විජේතුංග මහතා

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය

**ගරු ධුලිප් විජේසේකර මහතා**

**ගරු හේෂා විතානගේ මහතා**

**ගරු එස්. වියාලේන්දිරන් මහතා**

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**

**ගරු කුමාර වෙල්ගම මහතා**

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**

**ගරු මලික් සමරවික්‍රම මහතා**

**ගරු මංගල සමරවීර මහතා**

**ගරු රවීන්ද්‍ර සමරවීර මහතා**

**ගරු සන්දිත් සමරසිංහ මහතා**

**ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා**

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**

**ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා**

**ගරු මුත්තු සිවලිංගම් මහතා**

**ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**

**ගරු සුජීව සේනසිංහ මහතා**

**ගරු මාවෛ සෝ. සේනාධිරාජා මහතා**

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**

**ගරු චතුර සංදීප සේනාරත්න මහතා**

**ගරු විජිත් විජයමුණි සොයිසා මහතා**

**ගරු ඩී. එම්. ස්වාමිනාදන් මහතා**

**ගරු රවුෆ් හකීම් මහතා**

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**

**ගරු අබ්දුල් හලීම් මහතා**

**ගරු ඩී. බී. හේරත් මහතා**

**ගරු මනෝජ් හේවාගම්පලගේ මහතා**

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) කථානායකවරයා විසින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව—

(i) 2013 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ තෙවැනි කාණ්ඩයේ XI කොටස;

(ii) 2016 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ නවවැනි කාණ්ඩයේ XVI කොටස;

(iii) 2017 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXV කොටස, තෙවැනි කාණ්ඩයේ XI කොටස සහ නවවැනි කාණ්ඩයේ XII, XIII, XIV හා XV කොටස්;

(iv) 2018 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXIII හා XXIV කොටස්, තෙවැනි කාණ්ඩයේ XII කොටස සහ නවවැනි කාණ්ඩයේ X, XI හා XII කොටස්; සහ

(v) 2020 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ අටවැනි කාණ්ඩයේ II කොටස

පිළිගන්වන ලදී.

එකී යන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි ද, මුද්‍රණය කළ යුතු යැයිද නියෝග කරන ලදී.

(2) විදේශ සබඳතා අමාත්‍යවරයා සහ නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින්,(105 අධිකාරය) වෛද්‍ය ආඥාපනතේ 72 වගන්තිය සමඟ කියවිය යුතු 19(ඉ) වගන්තිය යටතේ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජනවාරි 26 දිනැති අංක 2055/54 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග සහ එම නියෝග සංශෝධනය කරමින් සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 දෙසැම්බර් 26 දිනැති අංක 2155/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග පිළිගන්වා, එම නියෝග සෞඛ්‍ය හා මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) විදේශ සබඳතා අමාත්‍යවරයා සහ නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින්, 2017 වර්ෂය සඳහා ජාතික පර්යේෂණ සභාවේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) විදේශ සබඳතා අමාත්‍යවරයා සහ නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2019.06.21 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරයේ තෙවැනි වාර්තාවේ මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතනවල 2017 වර්ෂයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව පිළිගන්වා, එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) විදේශ සබඳතා අමාත්‍යවරයා සහ නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින්, 2013, 2014 සහ 2015 වර්ෂ සඳහා තල් සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තා පිළිගන්වා, එම වාර්තා නිෂ්පාදන හා සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**2. කාරක සභා වාර්තා පිළිගැන්වීම :** (1) රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා වෙනුවෙන් එහි සාමාජික මන්ත්‍රී ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත;

(ii) ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත;

(iii) වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත් කෙටුම්පත;

(iv) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනා සම්මතය; සහ

(v) වාර්ෂික ඇස්තමේන්තු පිළිබඳ හඳුන්වාදීමේ සටහනෙහි දක්වා ඇති ජාතික අයවැය දෙපාර්තමේන්තුව යටතේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මඟින් සපයා ඇති අතිරේක ප්‍රතිපාදන පිළිබඳ සටහන

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(2) සෞඛ්‍ය සහ මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා විසින්, එම කාරක සභාව විසින් සකස් කරන ලද, "වතු වෛද්‍ය ඒකක රජයට පවරාගැනීම" සම්බන්ධයෙන් වූ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(3) නිෂ්පාදන හා සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු සුජිත් සංජය පෙරේරා මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) 2016, 2017 සහ 2018 වර්ෂ සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා;

(ii) 2016 සහ 2017 වර්ෂ සඳහා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තා;

(iii) 2014, 2015 සහ 2016 වර්ෂ සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තා;

(iv) 2016 වර්ෂය සඳහා ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශනය;

(v) 2014 වර්ෂය සඳහා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව;

(vi) 2016/2017 වර්ෂය සඳහා කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් හි වාර්ෂික වාර්තාව;

(vii) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(viii) 2018 වර්ෂය සඳහා කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමූපකාර සංවර්ධන, වෘත්තීය පුහුණු සහ නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(ix) 2018 වර්ෂය සඳහා පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(x) 2013/ 2014 සහ 2014/2015 වර්ෂ සඳහා මාන්තායි සෝල්ට් ලිමිටඩ් හි වාර්ෂික වාර්තා හා ගිණුම්

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(4) නිෂ්පාදන හා සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු සුජිත් සංජය පෙරේරා මහතා විසින්, එම කාරක සභාව විසින් සකස් කරන ලද "පුල්මුඩේ මුහුදේ ගිලී සුන්බුන් වූ 'MV කෝඩියලිටි'නෞකාවේ නැව්ගතකර තිබූ ඉල්මනයිට් තොගයේ හිමිකාරත්ව අර්බුදය" සම්බන්ධයෙන් වූ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(5) ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු මලිත් ජයතිලක මහතා විසින්, එම කාරක සභාව විසින් සකස් කරන ලද, "ජාතීන් හා ආගම් අතර මිත්‍රත්වය වර්ධනය කරවමින් නව ත්‍රස්තවාදය හා අන්තවාදය මුලිනුපුටා දැමීමට අවශ්‍ය වන පරිදි ජාතික ආරක්ෂාව තහවුරු කිරීමට අදාළ නීතිරීති සම්පාදනය සහ ක්‍රියාත්මක කරවීමේ යෝජනාවලිය" සම්බන්ධයෙන් වූ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(6) අධ්‍යාපනය සහ මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20(4)(ආ) වගන්තිය යටතේ නියමයන්;

(ii) 2018 වර්ෂය සඳහා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(iii) 2017 වර්ෂය සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව;

(iv) 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(v) 2017 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව;

(vi) 2017 වර්ෂය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනයේ වාර්ෂික වාර්තාව;

(vii) 2018 වර්ෂය සඳහා මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව හා වාර්ෂික ගිණුම්;

(viii) 2018 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(ix) 2017 වර්ෂය සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(x) 2018 වර්ෂය සඳහා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(xi) 2017 වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තිස් නව වැනි වාර්ෂික වාර්තාව;

(xii) 2017 සහ 2018 වර්ෂ සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තා;

(xiii) 2018 වර්ෂය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(xiv) 2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ වාර්ෂික වාර්තාව;

(xv) 2017 වර්ෂය සඳහා යාපනය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(xvi) 2017 වර්ෂය සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ වාර්ෂික වාර්තාව;

(xvii) 2016 වර්ෂය සඳහා තෘතික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව;

(xviii) 2018 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යායතනයේ වාර්ෂික වාර්තාව;

(xix) 2018 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව;

(xx) 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ පශ්චාද් ඉංග්‍රීසි උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(xxi) 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(xxii) 2018 වර්ෂය සඳහා මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව;

(xxiii) 2018 වර්ෂය සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව;

(xxiv) 2018 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන;

(xxv) 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(xxvi) 2018 වර්ෂය සඳහා වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව;

(xxvii) 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ

(xxviii) 2017 වර්ෂය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(7) අධ්‍යාපනය සහ මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා විසින්, එම කාරක සභාව විසින් සකස් කරන ලද "රාජ්‍ය සහ රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල සඳහා කර්මාන්ත ක්ෂේත්‍රය ඉලක්ක කරගත් පරිගණක විද්‍යා උපාධි පාඨමාලා හඳුන්වාදීම" සම්බන්ධයෙන් වූ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**3. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1) :** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ.භා. 1.00 සිට අ.භා. 6.30 දක්වා විය යුතු ය. අ.භා. 2.00ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 6.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**4. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2) :** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, 2020 පෙබරවාරි 20 වැනි බ්‍රහස්පතින්දා රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 7.30 දක්වා විය යුතු ය. අ.භා. 12.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 7.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**5. ශ්‍රී ලංකා පරිසර වෘත්තීයවේදීන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත :** සලකා බැලීම පිණිස නියෝගය කියවන ලදී.

පනත් කෙටුම්පත ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේදී සංශෝධනය වූ ආකාරයෙන් සලකා බලන ලදී.

"ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ සංශෝධන පිළිගත යුතුය"යි විදේශ සබඳතා අමාත්‍යවරයා සහ නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වැනි වර කියවිය යුතුය"යි විදේශ සබඳතා අමාත්‍යවරයා සහ නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් ඊට අනුකූලව තුන්වැනි වර කියවා සම්මත කරන ලදී.

**6. කල් තැබීම (භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව පිළිබඳ වෝහාරික විගණන වාර්තා) :** ‘‘මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය’’යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

(අ.භා. 2.50 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

‘‘ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා මූලාසනාරූඪ විය යුතුය’’යි, ගරු ඩී. බී. හේරත් මහතා, ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා ස්ථිර කරමින් යෝජනා කරන ලදි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.35 ට ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා මූලාසනාරූඪ විය.)

‘‘ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනාරූඪ විය යුතුය’’යි, රාජ්‍ය කළමනාකරණ හා ගිණුම් කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා යෝජනා කරන ලදි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 4.52 ට ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනාරූඪ වූවාය.)

‘‘ගරු මයන්ත දිසානායක මහතා මූලාසනාරූඪ විය යුතුය’’යි, අභ්‍යන්තර වෙළෙඳ සහ පාරිභෝගික සුභසාධන රාජ්‍ය අමාත්‍යවරයා යෝජනා කරන ලදි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 6.12 ට ගරු මයන්ත දිසානායක මහතා මූලාසනාරූඪ විය.)

එකල්හි වේලාව අ.භා. 6.30 වූයෙන්, මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අද දින සභා සම්මතිය අනුව 2020 පෙබරවාරි 20 වැනි බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වනතෙක් කල් ගියේය.